කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී තෙවන වසර පරීක්ෂණය - පළමු සෙමෙස්තරය - 2016/2017

**INR 3143- ගැටුම් විශ්ලේෂණය: න්‍යාය, ශිල්ප ක්‍රමය හා භාවිතය**

කාලය: **පැ. දෙකයි (02)**

ප්‍රශ්න **තුනකට (03)** පිළිතුරු සපයන්න.

---

1. කොටස් **දෙකටම (02)** පිළිතුරු සපයන්න.
   - I. ගැටුමක් යනු කුමක්ද? සැකෙවින් විස්තර කරන්න.
   - II. ගැටුම් විශ්ලේෂණ උපකරණයක් ලෙසට ABC ත්‍රිකෝණයේ ඇති ශක්තීන් සහ දුර්වලතා පරීක්ෂා කරන්න.

2. **එක්කෝ**
   - I. මාස්ලෝගේ සහ බර්ටන්ගේ (Maslow's and Burton's) මූලික අවශ්‍යතා න්‍යායන් (Basic Human Needs Theory) පිළිබඳව සන්සන්දනාත්මකව අධ්‍යයනය කරන්න.

   **නැතහොත්**

   - II. දික්ගැස්සුනු සමාජ ගැටුම් න්‍යාය (Protracted Social Conflict Theory) යොදා ගනිමින් විතගොං ගැටුම විශ්ලේෂණය කරන්න.

3. 'ගැටුම දුර්වල රාජ්‍ය (Fragile State) බිහිකිරීමට හේතුවකි.' මෙම ප්‍රකාශය සාපේක්ෂ විහීනතාවාදී න්‍යාය (Relative Deprivation Theory) භාවිතයෙන් විමසන්න.

4. ගැටුම් නිරාකරණ අධ්‍යයන ක්ෂේත්‍රයේ (Discipline of Conflict Resolution) වර්ධනය සඳහා ඓතිහාසික වර්ධනය යුග දෙකක (02) දායකත්වය සාකච්ඡා කරන්න.

5. අභ්‍යන්තර ගැටුම් (Internal Conflict) සහ ජාත්‍යන්තර ගැටුම් (International Conflict) අතර සම්බන්ධතාවය සුදුසු නිදසුන් මගින් සන්සන්දනය කරන්න.

6. පහත සඳහන් ඕනෑම **දෙකකට (02)** කෙටි සටහන් ලියන්න.
   - I. ගැටුම් කළමනාකරණ විධි (Conflict Management Styles)
   - II. අන්‍යෝන්‍ය පීඩාකාරී ස්ථම්භනය (Mutually Hurting Stalemate/MHS)
   - III. ගැටුම් නිරාකරණයේ ගතිකයන් (Dynamics of Conflict Resolution)
   - IV. මිලිටරිමය මැදිහත්වීම හා දේශීය සංස්කෘතිය ''වෝ මැෂින්'' (War Machine) චිත්‍රපටිය ඇසුරින්